# හොරණ ප්‍රාදේශීය සභාව

## කළුතර දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 අගෝස්තු 15 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 අගෝස්තු 08 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 29 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල මූලධන ආධාර වටිනාකම රු.17,914,269 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.34,219,346 ක් ලෙස දැක්වීම හේතුවෙන් වර්ෂයේ මූලධන ආධාර රු.16,305,077 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල මුද්දර ගාස්තු ආදායම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබූ අතර ඉකුත් වර්ෂයට අදාලව ලැබී තිබූ රු.28,697,542 ක මුද්දර ගාස්තු ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායමක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ වෛද්‍ය සැපයුම් ආයුර්වේද වියදම රු.150,000 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවෙන් ණය පදනම මත 2011 වර්ෂයේදී ලබාගත් අභ්‍යාස පොත් වෙනුවෙන් ගෙවිය යුතු රු.1,735,320 ක මුදල සඳහා ණයහිමි වෙන්කිරීම්

නොකිරීම හේතුවෙන් ණයහිමි වටිනාකම රු.1,735,320 ක් අඩුවෙන් හා සමුච්චිත අරමුදල රු.1,735,320 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.29,401,672 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායමට වඩා වැඩි වූ වියදම රු.10,485,433 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදයමට වඩා වැඩි වූ වියදම රු.43,597,495 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.33,112,062 ක වර්ධනයක් දක්නට ලැබුණි.

මූල්‍ය ප්‍රතිඵලයේ රු. 33,112,062 ක වර්ධනය කෙරෙහි ආදායම් රු.36,343,873 කින් වැඩිවීම හා වියදම් රු.3,231,811 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000' | රු.000' | රු.000' |
| (i) වරිපනම් හා බදු | 14,497 | 12,078 | 4,583 |
| (ii) බදු කුලී | 1,994 | 1,901 | 93 |
| (iii) බලපත්‍ර ගාස්තු | 916 | 916 | -- |

2.2.2 **වරිපනම් බදු**

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.6,432,198 ක හිඟයක් පැවති අතර වර්ෂය තුළදී හිඟයෙන් රු.4,342,873 ක් හෙවත් සියයට 68 ක් අයකරගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට වරිපනම් බිල් කිරීම රු.10,394,386 ක් වූ අතර වර්ෂය තුළදී ඉන් රු.7,976,219 ක් හෙවත් සියයට 77 ක් අයකරගෙන තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.4,507,492 ක් වූ හිඟ වරිපනම් ආදායම තුළ වසර 01 සිට 03 දක්වා ඒකක 767 කින් රු.1,079,067 ක්ද, වසර 03 සිට 05 දක්වා ඒකක 682 කින් රු.1,122,294 ක්ද, වසර 5 ත් 10 ත් අතර ඒකක 542 කින් රු.1,200,208 ක්ද, වසර 10 ට වැඩි ඒකක 257 කින් රු.42,771 ක්ද ඇතුළත් විය.

2.2.3 **අක්කර බදු**

සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.107,966 ක හිඟයක් පැවති අතර වර්ෂය තුළදී හිඟයෙන් රු.33,581 ක් හෙවත් සියයට 31 ක් අයකරගෙන තිබීම නිසා තවදුරටත් රු.74,385 ක ශේෂයක් අයකරගැනීමට තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **මෙහෙයුම්/කළමනාකරණ අකාර්යක්ෂමතා**

(අ) ගිණුම් අංක 041-1-001-5-1069561 දරන බැංකු ජංගම ගිණුමට අදාලව 2016 දෙසැම්බර් මාසයේදී බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීමේදී තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් ලෙස 2017 වර්ෂයේදී නිදහස් කර මුදල් ලබාගෙන තිබූ ස්ථාවර තැන්පත් රු.15,000,000 ක ශේෂයක් ඇතුළත් කර 2016 දෙසැම්බර් 31 දිනට මුදල් පොත සෘණ ශේෂයක් වීම වළක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට සේවකයින් 49 දෙනෙකුගෙන් අයකරගත් සේවක ඇප රු.80,000 ක මුදල ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) රු.258,350 ක වියදමක් දරා ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වන ලෙස අළුත්වැඩියා කර තිබූ ජෙනරේටරය එසේ ක්‍රියාත්මක කළ හැකි අයුරින් භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සභාව සතු වැලබඩවත්ත කොටස, පෝරුවදණ්ඩ, පුවක්වත්ත නොහොත් බණ්ඩාරවත්ත හා කනත්තවත්ත කොටස යන ඉඩම් හා ඒවායේ ගොඩනැගිලිවල අයිතිය ප්‍රකාශ කිරීමට ඔප්පු, ප්‍රකාශන ඔප්පු සභාව සතුව නොතිබුණි.

(ඉ) හොරණ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය මගින් පවත්වනු ලබන සෞඛ්‍ය සායනය වෙනුවෙන් සහභාගි වන සහා නොවන සායන කම්කරුවන් 13 දෙනෙකු සඳහා සභාව රු.2,354,450 ක මුදලක් ගෙවා තිබුණි.

3.2 <u>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</u>

(අ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අතුරු ව්‍යවස්ථාවක් පනවා නොතිබුණි.

(ආ) කසළ කළමනාකරණය සඳහා වැය වන පිරිවැය ආවරණය කරගැනීම සඳහා කසළ බදු පනවා නොතිබුණි.

4. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පාලනය

(ඇ) සේවක මණ්ඩල කළමනාකරණය

(ඈ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

(ඉ) අයවැය පාලනය